සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය ( සැකසුම - ඩබ්. චන්ද්‍රිකා සමරසිංහ )

සැප්තැම්බර් මාසය - 3 සතිය 15 පාඩම <u>- සිරම්බි අඩිය</u>

1)මෙම රූපයේ දැක්වෙන්නේ පුත්තලමට නුදුරින් පිහිටි සිරම්බි අඩිය ගම්මානයේ ජීවත් වන සිලෝන් කැෆ්රර්වරුන්ගේ නැටුමකි. පෙළ පොතේ සඳහන් වන ඔවුන් ගයන කාපිරි මාඤ්ඤ ගීතයක් රූපය යටින් ලියන්න.



2) සිලෝන් කැෆර් ජනයා මෙරටට පැමිණීම පිළිබඳ පුරා වෘත්තය පහත දැක්වේ. එය අනුපිළිවෙළින් සකසන්න.

1.ස්වාභාවික ව ම පිහිටා විවිධ බාධක ජය ගැනීමට පෘතුගීසීහු අපොහොසත් වූහ.

2.ඉන් පසු ව කැෆර්වරුන් මෙරටට පැමිණෙන්නේ වහල් සිරකරුවන් ලෙස ය.

3.කැෆර්වරු වර්තමානයේ සිරම්බි අඩිය ප්‍රදේශයේ ජීවත් වෙති.

4.පෘතුගීසි ජාතික ලොරෙන්සෝද අල්මේදා ප්‍රමුඛ කණ්ඩායම 1505 දී මෙරට මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගනු ලැබී ය.

5.ඔවුහු දෙවන ලෝක යුද්ධ සමයේ දී යුධ සෙබළුන් හෝ කඳවුරුවල ආවතේවකරුවන් ලෙස ක්‍රියා කළහ.

6.ඔවුහු ප්‍රථමයෙන් ම ජීවත් වූයේ කොම්පඤ්ඤ වීදිය ආශ්‍රිත ව ය.

7. එම නිසා කැලෑබද කටුක දිවිපෙවෙතක් ගෙවූ අප්‍රිකානුවන්ගේ සහාය ලබා ගැනීමට පෘතුගීසීහු සිතූ හ.

3)කෙටි පිළිතුරු සපයන්න

1.ඉංග්‍රීසි පාලන සමයෙහි කැෆර්වරුන් අනුයුක්ත කරනු ලැබූ රැකියා මොනවා ද?

2. කාපිරි මාඤ්ඤ ගීතවල වාද්‍ය භාණ්ඩ මොනවා ද?

3. කැෆර්වරුන්ගේ විවාහ උත්සවවල දී මනාලිය අඳින ගවුමේ නම කුමක් ද?

4. කැෆර් ජනයාගේ ආවාහවිවාහ උත්සව සිරිත්විරිත් මොනවා ද?

4) මෙම වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න

1. කාපිරි මාඤ්ඤ ගීත රචනා වී ඇත්තේ ඉංග්‍රීසියෙනි. 2. කාපිරි මාඤ්ඤවලට අප්‍රිකානු ගීයේ ආබාසය ලැබ ඇත.

3. .කැෆර්වරුන්ගේ පිරිමින් මාඤ්ඤ ගායනයට දක්ෂ ය.

4.වර්තමානයේ දී කැෆර් ජනයාගේ ආවාහවිවාහ උත්සව දින පහකට සීමා වී ඇත.

5.විවාහ දිනයේ දී මනමාලයා සිංහල ජාතික ඇඳුමෙන් සැරසේ. 6. කැෆර් ජනයා කෝන්දර අඳහති.

5)මම කතා පොතක් කියවමින් ඇඳෙහි වැතිරුණෙමි. අම්මා ද මාගේ හිස අතගාමින් මා පසෙකින් සිටියා ය. හිටිහැටියේ මා වලාකුළු අතර ය. සොඳුරු මල් උයන් , තුරු වදුලු , සිඟිති සුර කුමර කුමරියන් මා වටා ය. වලාකුළු අතරින් අපි ගමන් කළෙමු...... රචනයේ ඉතිරි කොටස නිර්මාණය කරන්න.